ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date: 2018/08/08

පැමිණිලිකරු : කේ.ආර් පෙරුමාල් මයා.
අංක : 06. මාගලේල්ගම.
නිකවැරටිය.

වගඋත්තරකරුවන් : පො.කො 24346 තරංග මයා.
පොලිස් ස්ථානය.
නිකවැරටිය.

පැමිණිලි අංකය : **HRC/K/237/16**

පැමිණිල්ල :-

පැමිණිලි පාර්ශවය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ. 2016.04.27 දින නිකවැරටිය පොදු වෙළඳ සංකීර්ණයෙහි පවත්වනු ලබන නිකවැරටිය ප්‍රවාහන සේවා සමූපකාර සමිතියේ මාසික රැස්වීම් වාරයට සහභාගී වීමට ප.ව 6.30 පමණ එහි ගිය බවත්. රැස්වීමට සහභාගී වීමට සාමාජික හැඳුනුම්පත අනිවාර්ය කර ඇති බව සමිති නිලධාරීන් දැනුම්දීම නිසා නැවත නිවසට ගොස් හැඳුනුම්පත ලබාගෙන සමිතියේ නිල ඇඳුම සහ සුදු සරමක් ඇද තමාගේ පුතා සමඟ අංක AAH-NW-7313 දරණ තමාගේ ත්‍රීවිල් රථයෙන් ප.ව 6.40 පමණ නැවත රැස්වීම පවත්වන ස්ථානය කරා පැමිණීමට පිටත් වූ බවත්.

නිකවැරටිය පුත්තලම් පාරේ නිකවැරටිය නගරය දෙසට පොලිස් ස්ථානය පසු කර වම්පස පිහිටි සෙන්ට්‍රල් ෆිනෑන්ස් ආයතනය අසලදී මාර්ගයේ ගිය සුදු පාට වෑන් රථයක් තමා පසුකර ඉදිරියට ගිය බවත් එවිට එම වෑන් රථයට පෙර ට්‍රැෆික් බයිසිකලයක් ධාවනය වෙමින් තිබූ බවත් තමා වෑන් රථයද සමගම එම වෑන් රථය පසුකර නගරය දෙසට ගිය බවත්. ඒ අවස්ථාවේදී පොලිස් නිලධාරියා තමාට නැවතිමට හෝ වෙනත් කිසිදු සංඥාවක් නොකළ බවත්. නිකවැරටිය තැපැල් කාර්යාලය අසල ඔරලෝසු කණුව අසලදී පිටුපසින් පැමිණි පොලිස් ට්‍රැෆික් රථය මාර්ගය හරස් කර නවතා ඉන් බැය ආ එක් නිලධාරියෙකු දකුණු පසින් පැමිණ පරුෂ වචනයෙන් බැණ තීවිල් රථයේ සිටි තමාට එකවරම පහරදුන් බවත් සඳහන් කර ඇත. එවිට තමාගේ වරද කුමක්දැයි ඇසූ බවත්. එවිට එම නිලධාරියා

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@sltnet.lk
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580/81/82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂනික / துரித அழைப்பு / Hotline: 011-2505575 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

තමාගේ බෙල්ලෙන් අල්ලාගත් බවත්. එවිට තමා පැලඳ සිටි රත්තරන් චේන් මාලය කැඩී ඔහුගේ අතට ගිය බවත් ඔහු නැවත කිහිපවරක් පහරදුන් බවත් පහරදෙද්දී තමා කළ වරද කුමක්ද යන්න විමසා කැඩී ඔහු අතට ගිය තමාගේ චේන් එක ආපසු දෙන මෙන් ඉල්ලීම් කළ විට නොනවත්වාම පහරදුන් බවත්. මේ අතර අනෙක් නිලධාරියා පොලිස් ස්ථානය දැනුවත් කර තිබූ බවත් සඳහන් කර ඇත. අනතුරුව සිවිල් ඇඳුමින් සැරසී නිකවැරටිය OIC මහතා පැමිණ ඔහු සමඟ පැමිණි අනෙක් SI මහතා සමඟ කිසි විමසීමකින් තොරව තමා බිම වැටෙන තුරුම නොනවත්වා තමාට පහරදුන් බවත් තමා බිම වැටුනු පසු තමාගේ ත්‍රීවිල් රථයෙන්ම තමා නිකවැරටිය පොලිස් ස්ථානයට රැගෙන ගිය බවත් දක්වා ඇත.

එසේම ට්‍රැෆික් බ්‍රාන්ච් එක තුළදීත් නැවත පහරවල් තුන හතරක් එල්ල කළ බවත්. එසේ පහරදී තමා නැවත රිසව් එකට භාර දුන් අතර. ඒ භාර දෙන විට තමාගේ අතේ තිබූ පවුම් 4¾ ක්වූ මුදු 03 ක් අත් ඔරලෝසුවක්ද එහි සිටි නිලධාරියාට භාර දුන් බවත් තමාගේ ජංගම දුරකථනය සහ මුදලින් රු. 15.720/- මුලින් ත්‍රීවිල් රථයේ කැබින් එකේ තිබූ බවත් ඒවා ත්‍රීවිල් රථයේ කැබින් එකෙහි ඇති බව තමා එම නිලධාරීන්ට දන්වා සිටි බවත් සඳහන් කර ඇත. ඉන් පසු වේලාව රාත්‍රී 8.15 ට පමණ තමා පොලිස් කුඩුවට දැමූ අතර තමාගේ කණ කැක්කුම් වීමත් පපුව රිදීමත් නිසා තමා කෑ ගැසූ බවත් ඉන් පසු තමා පොලිස් ජීප් රථයෙන් නිකවැරටිය මූලික රෝහලට ගෙනගිය බවත්. එහි සිටි වෛද්‍යවරිය හට තමා පොලිස් නිලධාරීන් කළ පහරදීමක් නිසා මෙසේ රෝගී තත්වයට පත්වී ඇති බව කියූ බවත් ඒ අනුව තමාව සෝදිසි කිරීමෙන් පසු අංක 10 වාට්ටුවේ අංක 30 දරණ ඇඳට තමා යොමුකර 2016.04.30 දින තමාව කුරුණෑගල මහ රෝහලට මාරු කරනු ලැබූ බවත්. එහි 2016.05.02 දින දක්වා ප්‍රතිකාර ලබා ගත් බවත්. සඳහන් කර ඇත.

2016.04.28 දින නිකවැරටිය මහේස්ත්‍රාත්තුමිය පැමිණ තමා පරීක්ෂා කර තමාගෙන් කටඋත්තර ලබාගත් බවත් පොලීසියේ පහරදීමක් මත තමාගේ කණ කකියන බවත් බෙල්ලේ සහ පපුවේ රිදුම් ඇති වූ බවත් දැක්වූ බවත්. තමාගේ ප්‍රකාශ සටහන් කරගැනීමෙන් පසු 2016.05.02 දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කරන බව පවසා සිටි බවත් පොලීසිය මඟින් තමා රෝහලේ ඇඳට තබා මාංචු දැමූ බවත් 2016.05.02 දින කුරුණෑගල රෝහලෙන් ටිකට් කපා මුදා හැරි බවත් බන්ධනාගාර නිලධාරීන් කුරුණෑගල රෝහලේදීම උසාවි නියෝගයක් ඇති බව පවසා තමා වාරියපොල බන්ධනාගාරය වෙත රැගෙන ගිය බවත් සඳහන් කර ඇත. අනතුරුව තමාව 2016.05.03 දින නිකවැරටිය මහේස්ත්‍රාත් උසාවියට ඉදිරිපත් කළ බවත් එහිදී ශරීර ඇප මත තමා මුදා හැරි බවත් ඇප ලබා දුන් පසු තමා නිකවැරටිය පොලිස් කාර්යාලයට ගොස් මේ පිළිබඳව පැමිණිල්ලක් ඉදිරිපත් කළ බවත් ඒ අනුව එහිදී තමාගේ ප්‍රකාශයක් සටහන් කරගත් බවත් නැවත තමාගේ බඩු මුට්ටු ලබා ගැනීමට තමා නිකවැරටිය පොලිස් ස්ථානයට ගිය බවත්. එහිදී තමාගේ ත්‍රීවීල් රථය උසාවියට ඉදිරිපත් කර ඇති නිසා එය ලබා දීමට නොහැකි බව පවසන ලද බවත් දක්වා ඇත. ත්‍රීවිල් රථයේ හිමිකාරිය තමාගේ බිරිඳ වන අයි. කමලායි යන අය වන බවද වැඩිදුරටත් සඳහන් කර ඇත.

ඉන් පසු ඉතිරි බඩු ලබා ගැනීමට විමසීමේදී කැබින් එකේ තිබූ රු. 15720/- න් 5840/- ක් පමණක් තිබූ අතර. ත්‍රීවිල් රථයේ ලයිෂන් එක. රක්ෂණ බලපත්‍රය. තමාගේ තාවකාලික රියදුරු බලපත්‍රය. ත්‍රීවිල්

රථයේ ජැක් එක. ටූල් කිට් එක ත්‍රීවිල් සමිතියේ කාඩ්පත ආදිය නැතිව තිබූ බවත් ඒ නිසා එම බඩු පොලිස් ස්ථානයෙන් ලබා නොගෙන අධිකරණයට ඒ පිළිබඳව 2016.05.06 දින දැනුම්දුන් බවත්. ඒ අනුව තමාගේ ත්‍රීවිල් රථය එදින තමාට ලබා නොදුන් බවත් තමාගේ බඩුවල අඩුපාඩු නිකවැරටිය පොලිස් අධිකාරී වෙත දැනුම් දෙන මෙන් දන්වා සිටි බවත් තමාගේ රත්තරන් චේන් එක ත්‍රීවිල් බලපත්‍රය. රක්ෂණ බලපත්‍රය. තාවකාලික රිය බලපත්‍රය. ජැක් එක. ත්‍රීවිල් සමිතියේ හැඳුනුම්පත ආදිය අඩුබව දන්වා සිටි බවත්. එතුමන් නිකවැරටිය පොලිස් ස්ථානය දැනුවත් කර මේ පිළිබඳව පැමිණිල්ලක් ලබා ගන්නා මෙන් දැනුම් දුන් බවත්. එම පැමිණිල්ල සටහන් කර ගනු ලැබුවේ 27 වන දින රාත්‍රී තමන්ට පහරදුන් එස් අයි මහතා බවත් පැමිණිල්ලේ දක්වා ඇත.

වගඋත්තරකාර පාර්ශවයේ සැළකිරීම් :-

පැමිණිල්ලට අදාළ වගඋත්තර පාර්ශවය විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති වාර්තාව මගින් දක්වා ඇත්තේ. 2016.04.27 දින නිකවැරටිය පොලිස් ස්ථානයේ අනුයුක්තව රාජකාරී කරනු ලබන පො.කො 24539 තරංග හා පො.කො 38862 ප්‍රීතිවංශ යන නිලධාරීන් පැය 15.00 සිට පැය 1.00 දක්වා රිය අනතුරු විමර්ශන රථවාහන නඩු ලබා ගැනීමේ යතුරුපැදි සංචාරක රාජකාරී යොදවා ඇති අතර නියෝග අනුව පැය 17.45 සිට පැය 18.45 දක්වා නිකවැරටිය ඔරලෝසු කණුව අසල රැඳී සිටිමින් රථවාහන නඩු ලබා ගැනීමේ රාජකාරියේ යෙදී සිට ඇති බවත් එම අවස්ථාවේදී අංක NW AAH-7313 දරණ ත්‍රීවිල් රථය පුත්තලම දෙස සිට කුරුණෑගල දෙසට ගමන් කර ඇති බවත් නිලධාරීන් විසින් විදුලි පන්දම් දල්වා නළා ශබ්ධ කර ත්‍රීවිල් රථය නතර කිරීමට සංඥා කළද එම සංඥා නොතකා මාර්ගයේ ගමන් ගන්නා අනෙකුත් වාහන අතරින් එහා මෙහා යමින් අපරීක්ෂාකාරී ලෙස ත්‍රීවිල් රථය වේගයෙන් පදවාගෙන ගොස් ඇති අතර පසුව නිලධාරීන් ඔවුන්ගේ අංක 147-3705 දරණ යතුරු පැදියෙන් මෙම ත්‍රීවිල් රථය පසුපස ගියද මෙම ත්‍රීවිල් රථය වේගයෙන් ගොස් අතුරු මාර්ගයකට හරවා ඇති බැවින් සොයා ගැනීමට අපහසු වී නැවත රාජකාරියේ යෙදී සිටීමට නියමිත ස්ථානය වෙත එන අවස්ථාවේදී මෙම ත්‍රීවිල් රථය පසු පසින් පැමිණ ඉතා වේගයෙන් මාර්ගයේ ගමන් ගන්නා වාහන වලට බාධාවන අයුරින් කුරුණෑගල දෙස සිට නිකවැරටිය නගරය දෙසට ගමන් කර ඇති බවත් පසුව නිලධාරීන් විසින් මෙම රථය පසුපස හඹා යන අවස්ථාවේදී මෙම රියදුරු ත්‍රීවිල් රථය නැවතත් නොනවත්වා පැදවීමට උත්සහ දරා ඇති බවත් එම අවස්ථාවේ යතුරු පැදියේ යතුරුපැදිකරු වන පො.කො 24539 තරංග නිලධාරියා යතුරු පැදියෙන් බැස ත්‍රීවිල් රථයේ ස්විච් යතුරු ගලවා අතට ගෙන ඇති බවත් ඉන් පසු මෙම ත්‍රීවිල් රථයේ රියදුරු ත්‍රීවිල් රථයෙන් බැස එම නිලධාරියාට අසභ්‍ය වචනයෙන් බැණ වදිමින් නිලධාරියාගේ නිල ඇඳුමින් ඇද 'තෝ කවුද මාව නවත්වන්න මම තමයි අරක්කු විකුණන බෝතල් කුමාර මට වැඩිය මෙහෙ චන්ඩියෙක් නෑ' බව පවසමින් නිලධාරියා තල්ලු කර ඇති බවත් දක්වා ඇත.

පසුව නිලධාරීන් දෙදෙනාම එක් වී ඔහු පැමිණි ත්‍රීවිල් රථයේ දමාගෙන පොලිස් ස්ථානය වෙත රැගෙන විත් පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇති බවත් ඔහු එම අවස්ථාවේ බීමතින් සිටි බවත් ත්‍රීවිල් රථයේ බලපත්‍ර. රක්ෂණ සහතිකය නිලධාරීන් විසින් ඉල්ලා ඇති අතරම කිසිවක් නොතිබූ බවත්. පසුව ඔහුගේ බීමත්කම ස්ථානයේ ඇති ඇල්කොලයසිර් ස්වසන නළ මඟින් පරීක්ෂාවට

ලක්කර ඇති අතර. එහිදී එම පුද්ගලයා බීමත්ව සිටි බවට අනාවරණය වී ඇති බවත්. පසුව නිලධාරියා විසින් මෙම පුද්ගලයාට වරද කියා දී අත්අඩංගුවට ගෙන ඇති බවත් සඳහන් කර ඇත. අනතුරුව මෙම පුද්ගලයා තමාට රෝහලට යාමට අවශ්‍ය බව කියා සිටි බැවින් එම අවස්ථාවේ ඔහුව නිකවැරටිය රජයේ රෝහල වෙත ඉදිරිපත් කර ඇති බවත් වෛද්‍යවරයා විසින් ඔහු නේවාසික ප්‍රතිකාර සඳහා අංක 10 වාට්ටුවේ ඇතුළත් කර ඇති බවත්. රෝහල් පොලීසිය මඟින් අධිකරණ වෛද්‍ය පෝරමය 194/16 නිකුත් කර ඇති අතර මෙතෙක් වෛද්‍ය වාර්තාව ලැබී නොමැති බවත්. අදාළ වාර්ථාවෙන් දන්වා ඇත.

එසේම මෙම සිද්ධිය සම්බන්ධව නිකවැරටිය ම/උ නඩු අංක බී 241/16 යටතේ ගරු අධිකරණයට කරුණු වාර්තා කරමින් සැකකරු ඉදිරිපත් කර ඇති අතර ඒ අනුව ගරු මහේස්ත්‍රාත්තුමිය විසින් සැකකරු වන කෝනාරගේ රාජ් පෙරුමාල් යනඅය 2016.05.02 දින දක්වා රක්ෂිත බන්ධනාගාරගත කරන ලද බවත් පසුව නඩුව නැවත කැඳවූ අවස්ථාවේ ඇප මත ගරු අධිකරණය මඟින් මුදවා හැර ඇති බවත්. සැකකරුට එරෙහිව නිකවැරටිය ම/උ නඩු අංක 2621/16 යටතේ ඉහත වරදවල් සම්බන්ධයෙන් නඩු පවරා ඇති බවත් සඳහන් කර ඇත. මෙම පැමිණිලිකරු විසින් පැමිණිල්ලේ සඳහන් කර ඇති පරිදි ඔහුට කිසිදු නිලධාරියෙකු පහරදීමක් සිදුකර නොමැති බවට දක්වන අතර ඔහුට අයත් කිසිදු දේපළක්. භාණ්ඩයක් ලියකියවිලි කිසිවක් නිලධාරීන් විසින් ලබාගෙන නොමැති බවත් ඉහත කෝනාරගේ රාජ් පෙරුමාල් යන අයට විරුද්ධව නීති විරෝධී මත්පැන් ළඟ තබා ගැනීම සම්බන්ධව නිකවැරටිය අධිකරණයේ නඩු අංක 6518 සහ 5052 යටතේ නඩු විභාග වෙමින් පවතින බවත් දක්වා ඇත.

මානව හිමිකම් කොමිෂන් සභා පරීක්ෂණයේදී අනාවරණය වී ඇති කරුණු :-

සිද්ධිය වූ දින පැමිණිලිකරු සිය පුත්‍රයා සමඟ ඔහුට අයත් ත්‍රීරෝද රථයෙන් ගමන් කරමින් සිටියදී කුරුණෑගල නගරයේදී මෙම පහරදීම සිදුවී ඇති බවත්. පැමිණිලිකරුට පොලිස් නිලධාරීන් කිහිප දෙනකු විසින් පහරදුන් බව ප්‍රකාශ කළද පොලිස් කොස්තාපල් 24349 තරංග පොලිස් නිලධාරියා මෙම පහරදීමට සෘජු ලෙස සම්බන්ධ බවට අනාවරණය වී ඇත.

අදාළ පහරදීම හේතුවෙන් කුරුණෑගල නිකවැරටිය රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබාගෙන ඇති අතර ඉදිරිපත් වී ඇති වෛද්‍ය වාර්තවා අනුව සිරීම් තුවාල ඇති බව තහවුරු වී ඇත. පැමිණිලිකරු විසින් මෙම පහරදීම හේතුවෙන් මුලින්ම ඇතුළත් වී ඇත්තේ නිකවැරටිය රොහලට වන අතර නිකවැරටිය රෝහලේ අංක 11368 දරණ ඇඳ ඉහපත් වාර්තාවත්ද අදාළ වෛද්‍යවරයා විසින් දකුණු කණෙහි ඇසීම අඩු බවට පැමිණිලිකරු විසින් කරන ලද ප්‍රකාශය සටහන් කර ඇත. කුරුණෑගල මහ රෝහලට ඇතුළත් කිරීමෙන් පසු මූලික ප්‍රතිකාර ලබාදීමේදී දකුණු කණ නොඇසෙන බවට අදාළ වෛද්‍යවරයා විසින් ඇඳ ඉහපත් සටහන් කර ඇත.

ඒ අනුව වගඋත්තරකාර පොලිස් නිලධාරියා විසින් පැමිණිලිකරුට පහරදීමක් සිදුකර ඇති බව වෛද්‍ය වාර්තාව අනුව තහවුරු වී ඇති අතර. සිද්ධිය සිදුවන අවස්ථාවේදී ත්‍රීරෝද රථයේ සිටි

පැමිණිලිකරුගේ පුත්‍රයා විසින් දෙන ලද සාක්ෂිය අනුවද වගඋත්තරකාර පොලිස් නිලධාරියා විසින් පැමිණිලිකරුට පහරදීමක් සිදුකර ඇති බව තහවුරු වී ඇත.

නිගමනය :-

වගඋත්තරකාර පොලිස් නිලධාරියා විසින් පැමිණිලිකරුට පහරදීමක් සිදුකර ඇති බව තහවුරු වන අතර එමගින් 1978 ශ්‍රී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාවෙන් සහතික කොට දී ඇති 'කෲර අමානුෂික වධහිංසාවකට හෝ අවමන් සහගත සැළකිල්ලකට භාජනය නොවීමට ඇති මූලික අයිතිවාසිකම' පැමිණිලිකරු සම්බන්ධයෙන් උල්ලංඝනය කර ඇති බව මානව හිමිකම් කොමිෂන් සභාව නිගමනය කරන ලදී.

නිර්දේශය :-

1. පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම හේතුවෙන් වගඋත්තරකරු විසින් පැමිණිලිකරු වෙත රු. 25.000/-ක මුදලක් ගෙවිය යුතුය.

2. වගඋත්තරකරුට එරෙහිව සුදුසු විනය පියවර ගැනීම සඳහා මෙහි පිටපතක් පොලිස්පතිවරයා වෙතද යොමු කරනු ලැබේ.

2018.09.10 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

B/

කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.